# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 71 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 14/01/2024<br>පැය 1710 |

## මාධ්‍ය නිවේදනය

**සීතාවකපුර පොලිස් කොට්ඨාසයේ ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව - ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

සීතාවකපුර පොලිස් කොට්ඨාසයේ ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව 2024.01.14 වන අද දින පෙරවරු 1000 ට මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් අවිස්සාවේල්ල පොලිස් ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

සීතාවකපුර පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් ස්ථාන 10 ක ප්‍රජා පොලිස් කමිටු සමාජිකයින් දැනුවත් කරන ලද අතර මෙය සබරගමුව පළාතේ පැවැත් වූ මුල්ම වැඩමුළුවද වේ. මෙහිදී ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් සඳහා ටී ෂර්ට් ලබාදීම, 05 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් 10 දෙනෙක් සඳහා ත්‍යාග පිරිනැමීම, සාර්ථක ලෙස පුනරුත්ථාපනය වූ තරුණයින් තිදෙනෙකුට රැකියා පත්වීම් ලිපි සහ මුදල් රුපියල් 10,000/- බැගින් ත්‍යාග පිරිනැමීම, සීතාවකපුර කොට්ඨාසයේ පොලිස් නිලධාරීන් සඳහා සුබසාධන උපකරණ පිරිනැමීම, "යුක්තිය" මෙහෙයුමට සක්‍රීයව දායක වූ හොඳම පොලිස් ස්ථානාධිපති ලෙස අවිස්සාවේල්ල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රසන්න ජයලත් මහතා සඳහා ත්‍යාග පිරිනැමීම, පුනරුත්ථාපනය කල දරුවන්ගේ දෙමව්පියන් හට ත්‍යාග ප්‍රධානය කිරීම මෙන්ම ගරු අමාත්‍යතුමන්ට හා වැඩබලන පොලිස්පතිතුමන්ට සමරු සිහිවටන ප්‍රදානය කිරීමක්ද මෙහිදී සිදුවිය.

මෙම කමිටු රැස්වීමෙන් අනතුරුව ගරු ඇමතිතුමන්, වැඩබලන පොලිස්පතිතුමන් හා සබරගමුව පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න මහතා ඇතුළු පිරිසක් රුක්රෝපණ වැඩසටහනකටද සහභාගී වූ අතර මෙම අවස්ථාවට කෑගල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රොෂාන් රාජපක්ෂ, ප්‍රජා පොලිස් කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඩී.කේ. ප්‍රියන්ත, සීතාවකපුර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සේනක වීරසිංහ යන මහත්වරුන් මෙම වැඩමුළුවට සහභාගී විය.